# වත්ථුපුරෙජාත ගණය

## 1. වත්ථුපුරෙජාත

### 1. අබ්‍යාකතො අබ්‍යාකතස්ස -

**අබ්‍යාකතො ධම්මො** යන කර්තෘ පාඨයෙන් චක්ඛු විඤ්ඤාණ යුගලයට ප්‍රත්‍යය වන මධ්‍යමායුෂ්ක වන අතීත භවාංගය හා සමඟ ඉපදුණු චක්ෂු වස්තුව -පෙ- කාය විඤ්ඤාණ යුගලයට ප්‍රත්‍ය වන මධ්‍යමායුෂ්ක වන අතීත භවාංගය හා සමඟ ඉපදුණු කාය වස්තුව.

(මරණාසන්න අවස්ථාවේදී චක්ඛු විඤ්ඤාණ යුගලයට ප්‍රත්‍ය වන චුති සිතට මත්තෙන් සතළොස් වැනි සිත හා උපන් චක්ඛු වස්තුව -පෙ- කාය විඤ්ඤාණ යුගලයට ප්‍රත්‍ය වන චුති සිතට මත්තෙන් සතළොස් වැනි සිත හා උපන් කාය වස්තුව)

පඤ්චවෝකාර භවයෙහි උපදින අවස්ථාවේ දී අරූපවිපාක සතර ද්විපඤ්ච විඤ්ඤාණ දසය හැර ප්‍රථම භවාංගය ආදී පසුව උපදින විපාක සිත් දෙවිස්සට සහ ක්‍රියා සිත් විස්සට ප්‍රත්‍යය වන ප්‍රතිසන්ධි ආදී පෙර සිත් සමඟ උපන් හදය වස්තුව

නිරෝධ සමාපත්තියෙන් වුට්ඨානය වන අවස්ථවේ දී අනාගාමී ඵල සිතට හා අර්හත් ඵල සිතට ප්‍රත්‍යය වන පෙර චිත්තක්ෂණයක කාලයේ ඉපදුණ හදය වස්තුව.

මරණාසන්න අවස්ථාවේදී පඤ්චවෝකාර භවාංග පසළොස ආවර්ජන ද්වය සම්පටිච්ඡන ද්වය සන්තීරණ ද්වය වොත්ථපන මරණාසන්න ක්‍රියා ජවන පස තදාරම්මණ චුති යන චිත්තයන්ට ප්‍රත්‍යය වන චුති සිතට මත්තෙන් සතළොස් වැනි සිත හා උපන් හදය වස්තුව යන ප්‍රත්‍යය ධර්මයන් ලැබේ.

**අබ්‍යාකතස්ස ධම්මස්ස** යන සම්ප්‍රදාන පාඨයෙන් පඤ්චවෝකාර භවයෙහි උපදින අවස්ථාවේදී අරූප විපාක සතර හැර ප්‍රථම භවාංග ආදී පසු පසුව උපදින විපාක සිත් දෙතිස ය ක්‍රියා සිත් විස්ස ය යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්.

**නිස්සයපච්චයෙන** යන කරණ පාඨයෙන් සුදුසු පරිදි එක්වර ලැබෙන නිස්සය ආරම්මණ පුරෙජාත ඉන්ද්‍රිය විප්පයුත්ත අත්ථි අවිගත ප්‍රත්‍ය ශක්ති සත අතුරෙන් නිස්සය සඞ්ඛ්‍යාත ශක්ති විශේෂය ලැබේ. (වත්ථුපුරෙජාත ප්‍රත්‍ය සය, ආරම්මණ යනුවෙන් මුළු ගණන සතකි)

**2. අබ්‍යාකතො කුසලස්ස -**

**අබ්‍යාකතො ධම්මො** යන කර්තෘ පාඨයෙන් පඤ්චවෝකාර භවයෙහි උපදින අවස්ථාවේ දී පසු පසුව උපදින කුසල් සිත් එක්විස්සට ප්‍රත්‍ය වන වොත්ථපන මනෝද්වාරාවර්ජන ආදී පෙර පෙර සිත් සමඟ උපදින හදය වස්තුව ය, මරණාසන්න කුසල ජවනයන් පසට ප්‍රත්‍යය වන චුති සිතට මත්තෙන් සතළොස් වැනි සිත හා උපන් හදය වස්තුව ය යන ප්‍රත්‍ය ධර්මයෝ ලැබෙත්.

**කුසලස්ස ධම්මස්ස** යන සම්ප්‍රදාන පාඨයෙන් පඤ්චවෝකාර භවයෙහි උපදින අවස්ථාවේදී පසු පසුව උපදින කුසල් සිත් එක්විස්ස යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්.

**නිස්සයපච්චයෙන** යන කරණ පාඨයෙන් එකවර සුදුසු පරිදි ලැබෙන නිස්සය ආරම්මණ පුරෙජාත විප්පයුත්ත අත්ථි අවිගත ප්‍රත්‍ය ශක්ති සයෙන් නිස්සය සඞ්ඛ්‍යාත ශක්ති විශේෂය ලැබේ.

**3. අබ්‍යාකතො අකුසලස්ස -**

**අබ්‍යාකතො ධම්මො** යන කර්තෘ පාඨයෙන් පඤ්චවෝකාර භවයෙහි උපදින අවස්ථාවේදී පසු පසුව උපදින අකුසල් සිත් දොළොසට ප්‍රත්‍ය වන වොත්ථපන මනෝද්වාරාවර්ජන ආදී පෙර පෙර සිත් සමඟ උපදින හදය වස්තුව ය, මරණාසන්න අකුසල ජවනයන් පසට ප්‍රත්‍යය වන චුති සිතට මත්තෙන් සතළොස් වැනි සිත හා උපන් හදය වස්තුව ය යන ප්‍රත්‍ය ධර්මයෝ ලැබෙත්.

**අකුසලස්ස ධම්මස්ස** යන සම්ප්‍රදාන පාඨයෙන් පසු පසුව උපදින අකුසල සිත් දොළොස යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්.

**නිස්සයපච්චයෙන** යන කරණ පාඨයෙන් සුදුසු පරිදි එක්වර ලැබෙන නිස්සය ආරම්මණ ආරම්මණාධිපති ආරම්මණූපනිස්ස පුරෙජාත විප්පයුත්ත අත්ථි අවිගත යන ප්‍රත්‍ය ශක්ති අට අතුරෙන් නිස්සය සඞ්ඛ්‍යාත ශක්ති විශේෂය ලැබේ. (ආරම්මණ ගණයේ ප්‍රත්‍යය අට)

# 6. වත්ථුපුරෙජාතින්ද්‍රිය

### 1. අබ්‍යාකතො අබ්‍යාකතස්ස -

**අබ්‍යාකතො ධම්මො** යන කර්තෘ පාඨයෙන් ද්විපඤ්ච විඤ්ඤාණ දසයට ප්‍රත්‍යය වන මධ්‍යමායුෂ්ක වන අතීත භවාංගය හා සමග ඉපදුණු පඤ්ච වස්තූන් යන ප්‍රත්‍ය ධර්මයෝ ලැබෙත්.

**අබ්‍යාකතස්ස ධම්මස්ස** යන සම්ප්‍රදාන පාඨයෙන් ද්විඤ්ච විඤ්ඤාණ දස ය සර්වචිත්ත සාධාරණ චෛතසික සත ය යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්.

**පුරෙජාතපච්චයෙන** යන කරණ පාඨයෙන් නිස්සය පුරෙජාත ඉන්ද්‍රිය විප්පයුත්ත අත්ථි අවිගත යන ප්‍රත්‍ය ශක්ති සය අතුරෙන් පුරෙජාත සඞ්ඛ්‍යාත ශක්ති විශේෂය ලැබේ.

## පකතූපනිස්සය ගණය

# 1. පකතූපනිස්ස

### 1. කුසලො කුසලස්ස -

**කුසලො ධම්මො** යන කර්තෘ පාඨයෙන් අර්හත් මාර්ග සිත හැර බලවත් වන කුසල් සිත් විස්ස ය චෛතසික අටතිස ය යන ප්‍රත්‍ය ධර්මයෝ ලැබෙත්.

**කුසලස්ස ධම්මස්ස** යන සම්ප්‍රදාන පාඨයෙන් කුසල් සිත් එක් විස්ස ය චෛතසික අටතිස ය යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්.

**උපනිස්සයපච්චයෙන** යන කරණ පාඨයෙන් පකතූපනිස්සය ශක්තිය ලැබේ.

**2. කුසලො අකුසලස්ස -**

**කුසලො ධම්මො** යන කර්තෘ පාඨයෙන් බලවත් වන ලෞකික කුසල සතළොස ය චෛතසික අටතිස ය යන ප්‍රත්‍ය ධර්මයෝ ලැබෙත්.

**අකුසලස්ස ධම්මස්ස** යන සම්ප්‍රදාන පාඨයෙන් අකුසල සිත් දොළොස ය චෛතසික සත්විස්ස ය යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්.

**උපනිස්සයපච්චයෙන** යන කරණ පාඨයෙන් පකතූපනිස්සය ශක්තිය ලැබේ.

**3. කුසලො අබ්‍යාකතස්ස -**

**කුසලො ධම්මො** යන කර්තෘ පාඨයෙන් අර්හත් මාර්ගය හැර බලවත් වන කුසල් සිත් විස්ස ය චෛතසික අටතිස ය යන ප්‍රත්‍ය ධර්මයෝ ලැබෙත්.

**අබ්‍යාකතස්ස ධම්මස්ස** යන සම්ප්‍රදාන පාඨයෙන් විපාක සිත් සතිස ය ක්‍රියා සිත් විස්ස ය චෛතසික අටතිස ය යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්.

**උපනිස්සයපච්චයෙන** යන කරණ පාඨයෙන් පකතූපනිස්සය ශක්තිය ලැබේ. තවත් ක්‍රමයකින් - සුදුසු පරිදි එක්වර ප්‍රත්‍ය වන උපනිස්සය, අනන්තර, සමනන්තර, කම්ම, නත්ථි, විගත ප්‍රත්‍ය සය.

**4. අකුසලො අකුසලස්ස -**

**අකුසලො ධම්මො** යන කර්තෘ පාඨයෙන් බලවත් වන අකුසල සිත් දොළොස ය චෛතසික සත්විස්ස ය යන ප්‍රත්‍ය ධර්මයෝ ලැබෙත්.

**අකුසලස්ස ධම්මස්ස** යන සම්ප්‍රදාන පාඨයෙන් අකුසල සිත් දොළොස ය චෛතසික සත්විස්ස ය යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්.

**උපනිස්සයපච්චයෙන** යන කරණ පාඨයෙන් පකතූපනිස්සය ශක්තිය ලැබේ.

**5. අකුසලො කුසලස්ස -**

**අකුසලො ධම්මො** යන කර්තෘ පාඨයෙන් බලවත් වන අකුසල සිත් දොළොස ය චෛතසික සත්විස්ස ය යන ප්‍රත්‍ය ධර්මයෝ ලැබෙත්.

**කුසලස්ස ධම්මස්ස** යන සම්ප්‍රදාන පාඨයෙන් කුසල සිත් එක්විස්ස ය චෛතසික අටතිස ය යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්.

**උපනිස්සයපච්චයෙන** යන කරණ පාඨයෙන් පකතූපනිස්සය ශක්තිය ලැබේ.

**6. අකුසලො අබ්‍යාකතස්ස -**

**අකුසලො ධම්මො** යන කර්තෘ පාඨයෙන් බලවත් වන අකුසල සිත් දොළොස ය චෛතසික සත්විස්ස ය යන ප්‍රත්‍ය ධර්මයෝ ලැබෙත්.

**අබ්‍යාකතස්ස ධම්මස්ස** යන සම්ප්‍රදාන පාඨයෙන් විපාක සිත් සතිස ය ක්‍රියා සිත් විස්ස ය චෛතසික අටතිස ය යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්.

**උපනිස්සයපච්චයෙන** යන කරණ පාඨයෙන් පකතූපනිස්සය ශක්තිය ලැබේ.

**7. අබ්‍යාකතො අබ්‍යාකතස්ස -**

**අබ්‍යාකතො ධම්මො** යන කර්තෘ පාඨයෙන් බලවත් වන විපාක සිත් සතිස ක්‍රියා සිත් විස්ස ය චෛතසික අටතිස ය රූප අටවිස්ස ය යන ප්‍රත්‍ය ධර්මයෝ ලැබෙත්.

**අබ්‍යාකතස්ස ධම්මස්ස** යන සම්ප්‍රදාන පාඨයෙන් විපාක සිත් සතිස ය ක්‍රියා සිත් විස්ස ය චෛතසික අටතිස ය යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්.

**උපනිස්සයපච්චයෙන** යන කරණ පාඨයෙන් පකතූපනිස්සය ශක්තිය ලැබේ.

**8. අබ්‍යකතො කුසලස්ස -**

**අබ්‍යාකතො ධම්මො** යන කර්තෘ පාඨයෙන් අර්හත් ඵලය හැර බලවත් වන විපාක සිත් පන්තිස ය ක්‍රියා සිත් විස්ස ය චෛතසික අටතිස ය රූප අටවිස්ස ය යන ප්‍රත්‍ය ධර්මයෝ ලැබෙත්.

**කුසලස්ස ධම්මස්ස** යන සම්ප්‍රදාන පාඨයෙන් කුසල සිත් එක්විස්ස ය චෛතසික අටතිස ය යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්.

**උපනිස්සයපච්චයෙන** යන කරණ පාඨයෙන් පකතූපනිස්සය ශක්තිය ලැබේ.

**9. අබ්‍යාකතො අකුසලස්ස -**

**අබ්‍යාකතො ධම්මො** යන කර්තෘ පාඨයෙන් බලවත් වන ලෞකික විපාක දෙතිස ය ක්‍රියා සිත් විස්ස ය චෛතසික පන්තිස ය රූප අටවිස්ස ය යන ප්‍රත්‍ය ධර්මයෝ ලැබෙත්.

**අකුසලස්ස ධම්මස්ස** යන සම්ප්‍රදාන පාඨයෙන් අකුසල සිත් දොළොස ය චෛතසික සත් විස්ස ය යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්.

**උපනිස්සයපච්චයෙන** යන කරණ පාඨයෙන් පකතූපනිස්සය ශක්තිය ලැබේ.

## නානාක්ෂණික කර්ම

**1. කුසලො අබ්‍යාකතස්ස**

**කුසලො ධම්මො** යන කර්තෘ පාඨයෙන් කුසල විපාක නාමස්කන්ධ එකුන්තිසට ද කර්මජ රූපයන්ට ද ප්‍රත්‍ය වන අතීත කුසල චේතනා එක්විස්සෙහි ඇති චේතනා ප්‍රත්‍ය ධර්මයෝ වෙත්.

**අබ්‍යාකතස්ස ධම්මස්ස** යන සම්ප්‍රදාන පාඨයෙන් කුසල විපාක එකුන්තිස් නාමස්කන්ධයෝ ය කර්මජ රූපයෝ ය යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්.

**කම්මපච්චයෙන** යන කරණ පාඨයෙන් සුදුසු පරිදි එක්වර ලැබෙන කම්ම අනන්තර සමනන්තර උපනිස්සය නත්ථි විගත යන ප්‍රත්‍ය ශක්ති සය අතුරින් නානක්ෂණික කර්ම සඞ්ඛ්‍යාත ශක්ති විශේෂය ලැබේ.

**2. අකුසලො අබ්‍යාකතස්ස**

**අකුසලො ධම්මො** යන කර්තෘ පාඨයෙන් අකුසල විපාක නාමස්කන්ධ සතට ද කර්මජ රූපයන්ට ද ප්‍රත්‍ය වන අතීත අකුසල සිත් දෙළොසෙහි  වූ චේතනා ප්‍රත්‍යයෝ ලැබෙත්.

**අබ්‍යාකතස්ස ධම්මස්ස** යන සම්ප්‍රදාන පාඨයෙන් සත් අකුසල විපාක නාමස්කන්ධයෝ ද කර්මජ රූපයෝ ද යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබේ.

**කම්මපච්චයෙන** යන කරණ පාඨයෙන් එක්වර ලැබෙන කම්ම උපනිස්සය ශක්ති දෙක අතරින් නානක්ෂණික කර්ම සඞ්ඛ්‍යාත ශක්ති විශේෂය ලැබේ.

## රූපාහාර ගණය

**1. අබ්‍යාකතො අබ්‍යාකතස්ස**

**අබ්‍යාකතො ධම්මො** යන කර්තෘ පාඨයෙන් සමාන කලාප හා  විවිධ කලාප වන චතුසමුට්ඨානික රූපයන්ට ප්‍රත්‍ය වන චතුසමුට්ඨානික ඕජාව යන ප්‍රත්‍ය ධර්මයෝ ලැබෙත්.

**අබ්‍යාකතස්ස ධම්මස්ස** යන සම්ප්‍රදාන පාඨයෙන් සමාන කලාප හා  විවිධ කලාප වන චතුසමුට්ඨානික රූප යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්.

**ආහාරපච්චයෙන** යන කරණ පාඨයෙන් ආහාර, අත්ථි, අවිගත යන ප්‍රත්‍ය ශක්ති තුන අතුරෙන් ආහාර සඞ්ඛ්‍යාත ශක්ති විශේෂය ලැබේ.

## රූපජීවිතින්ද්‍රිය

**1. අබ්‍යාකතො අබ්‍යාකතස්ස**

**අබ්‍යාකතො ධම්මො** යන කර්තෘ පාඨයෙන් රූපජීවිතින්ද්‍රිය හැර කලාප සමාන කර්මජරූපයන්ට ප්‍රත්‍ය වන රූපජීවිතින්ද්‍රිය යන ප්‍රත්‍ය ධර්මයෝ ලැබෙත්.

**අබ්‍යාකතස්ස ධම්මස්ස** යන සම්ප්‍රදාන පාඨයෙන් රූපජීවිතින්ද්‍රිය හැර කලාප සමාන කර්මජරූපයෝ යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්.

**ඉන්ද්‍රියපච්චයෙන** යන කරණ පාඨයෙන් ඉන්ද්‍රිය, අත්ථි, අවිගත යන ප්‍රත්‍ය ශක්ති තුන අතුරෙන් ඉන්ද්‍රිය සඞ්ඛ්‍යාත ශක්ති විශේෂය ලැබේ.

## අනන්තරූපනිස්සය ගණය

# 1. අනන්තර

**1. කුසලො කුසලස්ස**

**කුසලො ධම්මො** යන කර්තෘ පාඨයෙන් අවසාන ජවනය වර්ජිත පූර්ව පූර්ව ලෞකික කුසල් සිත් නාමස්කන්ධ සතළොස ය යන ප්‍රත්‍ය ධර්මයෝ ලැබෙත්.

**කුසලස්ස ධම්මස්ස** යන සම්ප්‍රදාන පාඨයෙන් ප්‍රථම ජවනය හැර පශ්චිම පශ්චිම කුසල සිත් නාමස්කන්ධ එක්විස්ස යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්.

**අනන්තරපච්චයෙන** යන කරණ පාඨයෙන් සුදුසු පරිදි ලැබෙන අනන්තර සමනන්තර උපනිස්සය ආසේවන නත්ථි විගත යන ප්‍රත්‍ය ශක්ති සයෙන් අතුරෙන් අනන්තර සඞ්ඛ්‍යාත ශක්ති විශේෂය ලැබෙ.

**2. කුසලො අබ්‍යාකතස්ස**

**කුසලො ධම්මො** යන කර්තෘ පාඨයෙන් ලෞකික කුසල සිත් සතළොසේ අන්තිම ජවනය සහ මාර්ග සිත් සතර යන ප්‍රත්‍ය ධර්මයෝ ලැබෙත්.

**අබ්‍යාකතස්ස ධම්මස්ස** යන සම්ප්‍රදාන පාඨයෙන් සන්තීරණ සිත් තුන ය මහාවිපාක සිත් අට ය මහද්ගත විපාක සිත් නවය ය ඵල සිත් සතර යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්.

**අනන්තරපච්චයෙන** යන කරණ පාඨයෙන් සුදුසු පරිදි එක්වර ලැබෙන අනන්තර සමනන්තර උපනිස්සය ආසේවන නත්ථි විගත යන ප්‍රත්‍ය ශක්ති සය අතුරෙන් අනන්තර සඞ්ඛ්‍යාත ශක්ති විශේෂය ලැබෙ.

**3. අකුසලො අකුසලස්ස**

**අකුසලො ධම්මො** යන කර්තෘ පාඨයෙන් අවසාන ජවනය වර්ජිත පූර්ව පූර්ව අකුසල සිත් දෙළොස ය යන ප්‍රත්‍ය ධර්මයෝ ලැබෙත්.

**අකුසලස්ස ධම්මස්ස** යන සම්ප්‍රදාන පාඨයෙන් ප්‍රථම ජවනය හැර පශ්චිම පශ්චිම අකුසල සිත් දෙළොස ය යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්.

**අනන්තරපච්චයෙන** යන කරණ පාඨයෙන් අනන්තර සමනන්තර උපනිස්සය ආසේවන නත්ථි විගත ප්‍රත්‍ය යන ප්‍රත්‍ය ශක්ති සය අතුරෙන් අනන්තර සඞ්ඛ්‍යාත ශක්ති විශේෂය ලැබේ.

**4. අකුසලො අබ්‍යාකතස්ස**

**අකුසලො ධම්මො** යන කර්තෘ පාඨයෙන් දෙළොස් අකුසලයන්ගේ අවසාන ජවනය යන ප්‍රත්‍ය ධර්මයෝ ලැබෙත්.

**අබ්‍යාකතස්ස ධම්මස්ස** යන සම්ප්‍රදාන පාඨයෙන් සන්තීරණ සිත් තුන ය මහාවිපාක සිත් අට ය මහද්ගත විපාක සිත් නවය ය යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්.

**අනන්තරපච්චයෙන** යන කරණ පාඨයෙන් එක්වර ලැබෙන අනන්තර සමනන්තර උපනිස්සය නත්ථි විගත යන ප්‍රත්‍ය ශක්ති පස අතුරෙන් අනන්තර සඞ්ඛ්‍යාත ශක්ති විශේෂය ලැබෙ.

**5. අබ්‍යාකාතො අබ්‍යාකතස්ස**

**අබ්‍යාකතො ධම්මො** යන කර්තෘ පාඨයෙන් රහතන් වහන්සේගේ චුති සිත හැර පූර්ව පූර්ව විපාක සිත් සතිස ය ක්‍රියා සිත් විස්ස ය යන ප්‍රත්‍ය ධර්මයෝ ලැබෙත්.

**අබ්‍යාකතස්ස ධම්මස්ස** යන සම්ප්‍රදාන පාඨයෙන් රහතන් වහන්සේගේ චුති සිත සමග පශ්චිම පශ්චිම විපාක සිත් සතිස ය ක්‍රියා සිත් විස්ස ය යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්.

**අනන්තරපච්චයෙන** යන කරණ පාඨයෙන් සුදුසු පරිදි එක්වර ලැබෙන අනන්තර සමනන්තර උපනිස්සය ආසේවන නත්ථි විගත යන ප්‍රත්‍ය ශක්ති සය අතුරෙන් අනන්තර සඞ්ඛ්‍යාත ශක්ති විශේෂය ලැබේ.

**6. අබ්‍යාකතො කුසලස්ස**

**අබ්‍යාකතො ධම්මො** යන කර්තෘ පාඨයෙන් ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජන සිත් ය යන ප්‍රත්‍ය ධර්මයෝ ලැබෙත්.

**කුසලස්ස ධම්මස්ස** යන සම්ප්‍රදාන පාඨයෙන් මහා කුසල ප්‍රථම ජවනය යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්.

**අනන්තරපච්චයෙන** යන කරණ පාඨයෙන් එක්වර ලැබෙන අනන්තර සමනන්තර උපනිස්සය නත්ථි විගත ප්‍රත්‍ය ශක්ති පස අතුරෙන් අනන්තර සඞ්ඛ්‍යාත ශක්ති විශේෂය ලැබේ.

**7. අබ්‍යාකතො අකුසලස්ස**

**අබ්‍යාකතො ධම්මො** යන කර්තෘ පාඨයෙන් ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජන සිත් ය යන ප්‍රත්‍ය ධර්මයෝ ලැබෙත්.

**අකුසලස්ස ධම්මස්ස** යන සම්ප්‍රදාන පාඨයෙන් දොළොස් අකුසල ප්‍රථම ජවන යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්.

**අනන්තරපච්චයෙන** යන කරණ පාඨයෙන් එක්වර ලැබෙන අනන්තර සමනන්තර උපනිස්සය නත්ථි විගත ප්‍රත්‍ය ශක්ති පසෙන් අනන්තර සඞ්ඛ්‍යාත ශක්ති විශේෂය ලැබේ.

# 2. ආසේවන

**1. කුසලො කුසලස්ස 2. අකුසලො අකුසලස්ස** අනන්තර ප්‍රත්‍යය හා සමාන ය.

**3. අබ්‍යාකතො අබ්‍යාකතස්ස**

**අබ්‍යාකතො ධම්මො** යන කර්තෘ පාඨයෙන් පශ්චිම පශ්චිම ක්‍රියා ජවනයන්ට අටළොසට ප්‍රත්‍යය වන අන්තිම ජවනය වර්ජිත පූර්ව පූර්ව ක්‍රියා ජවන අටළොස යන ප්‍රත්‍ය ධර්මයෝ ලැබෙත්.

**අබ්‍යාකතස්ස ධම්මස්ස** යන සම්ප්‍රදාන පාඨයෙන් පශ්චිම පශ්චිම ක්‍රියා ජවන අටළොස යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්.

**ආසෙවනපච්චයෙන** යන කරණ පාඨයෙන් එක්වර ලැබෙන ආසෙවන අනන්තර සමනන්තර උපනිස්සය නත්ථි විගත ප්‍රත්‍ය ශක්ති සය අතුරෙන් ආසෙවන සඞ්ඛ්‍යාත ශක්ති විශේෂය ලැබේ.

# 3. අනන්තරකම්ම

**1. කුසලො අබ්‍යාකතස්ස**

**කුසලො ධම්මො** යන කර්තෘ පාඨයෙන් මාර්ග සිතට අනතුරුව උපදින ඵල සිත් සතරට ප්‍රත්‍යය වන මාර්ග සිත් සතරෙහි චෙතනා යන ප්‍රත්‍ය ධර්මයෝ ලැබෙත්.

**අබ්‍යාකතස්ස ධම්මස්ස** යන සම්ප්‍රදාන පාඨයෙන් මාර්ගයට අනතුරුව උපදින ඵල සතර යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්.

**කම්මපච්චයෙන** යන කරණ පාඨයෙන් එක්වර ලැබෙන අනන්තර සමනන්තර උපනිස්සය කම්ම නත්ථි විගත

2.3 ස්වරූපාර්ථ - වත්ථුපුරේජාතාදී සය

ප්‍රත්‍ය ශක්ති සය අතුරෙන් කම්ම සඞ්ඛ්‍යාත ශක්ති විශේෂය ලැබේ.